# ගමේ ආණ්ඩුව මහින්ද චින්තනයට

කාශ්‍යප මල්ලවආරච්චි

පුංචි ආණ්ඩුව, ගමේ ආණ්ඩුව යනාදී නොයෙක් නම් වලින් හඳුන්වන පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමේ පළාත් පාලන මැතිවරණය පසුගියදා අවසන් විය. මෙවර පළාත් පාලන මැතිවරණය පැවැත්වූ ආයතන 266 න් 223 ක බලය අත්පත් කර ගනිමින් මෙවර පළාත් පාලන මැතිවරණයේදී විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබීමට එක්සත් ජනතා නිදහස් සන්ධානය සමත්ව ඇත. එය වෙනත් ලෙසකට පවසතොත් රටේ ආණ්ඩු කරන එක්සත් ජනතා නිදහස් සන්ධානය ගමේ ආණ්ඩු සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගන්නා මැතිවරණයෙන්ද ජයග්‍රහණය කර ඇත.

ඔවුන් රටේ ආණ්ඩුවේ මෙන්ම ගමේ ආණ්ඩු බහුතරයකත් බලය අල්ලා ඇත. ඒ සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානය ලබාගෙන ඇති ඡන්ද ප්‍රමාණය 33, 73,966 කි. එය ප්‍රකාශිත ඡන්දවල ප්‍රතිශතයක් ලෙස ගතහොත් සියයට 48.81 කි.

විපක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයට මෙවර ලබාගත හැකිවූයේ ඡන්ද 24, 19, 631 ක් පමණකි. එය ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ගතහොත් සියයට 45.19 කි. එක්සත් ජාතික පක්ෂය 2002 වසරේදී බලය හිමි කරගත් පළාත් පාලන ආයතන ප්‍රමාණයෙන් ඔවුන්ට මෙවර බහුතර ආයතන සංඛ්‍යාවක බලය අහිමිව ඇත. එපමණක් නොව එක්සත් ජාතික පක්ෂය වසර 43 ක් තිස්සේ බලය ඉසිලූ කුරුණෑගල නගර සභාවේ බලයත් වසර 45 ක් තිස්සේ අඛණ්ඩ පාලනයකට හිමිකම් කියූ හම්බන්තොට නගර සභාවේ බලයත් එක්සත් ජාතික පක්ෂයට මෙවර අහිමිව ඇත. මීගමුව නගර සභාවේ බලයද දශක කිහිපයකට පසු එජාපයෙන් ගිලිහී ගොස් තිබේ. එක්සත් ජාතික පක්ෂයට මෙවර පළාත් පාලන මැතිවරණයේදී රැකගත හැකිවූයේ පළාත් පාලන ආයතන 35 ක බලය පමණි.

ගම ජවිපෙට යන සටන් පාඨය යටතේ මෙවර පළාත් පාලන මැතිවරණයට තරඟ කළ ජනතා විමුක්ති පෙරමුණට ජයගත හැකිවූයේ ඔවුන් බලයේ සිටි තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව පමණක් වුවද ගමේ මෙන්ම නගරයේ ඡන්ද වර්ධනයක් ඇති කර ගැනීමට එම පක්ෂය සමත්ව ඇති බව මෙවර මැතිවරණ ප්‍රතිඵලයෙන් පෙනී යයි. ජ.වි.පෙ. මෙවර පළාත් පාලන මැතිවරණයේදී ලබාගෙන ඇති මුළු ඡන්ද ප්‍රමාණය 8,21,764 කි. එය ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ගතහොත් සියයට 11.99 ක ප්‍රතිශතයකි. එය එම පක්ෂය ඉතිහාසයේ ලබා ඇති වැඩිම ප්‍රතිශතයද වේ. ගමේ ඡන්ද පදනම වර්ධනය කර ගන්නා අතර තිස්සමහාරාමය ප්‍රාදේශීය සභාවේ නියෝජිතයද එකකින් ඉහළ දමා ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ සමත්ව ඇත. එම පක්ෂයට තිස්සමහරාම ප්‍රාදේශීය සභාවේ සිටි නියෝජිතයින් සංඛ්‍යාව 06 කි. පොදුජන එක්සත් පෙරමුණට නියෝජිතයින් 03 ක් සහ එක්සත් ජාතික පක්ෂයට එම ආසනයේ නියෝජිතයින් 03 ක් වශයෙන් සිටියේය. ජ.වි.පෙ. නියෝජිත සංඛ්‍යාව එකකින් වැඩිකර ගනිමින් මෙවර නියෝජිතයින් 07 දෙනෙකු තේරී පත්වනවිට එක්සත් ජාතික පක්ෂ නියෝජිත සංඛ්‍යාව එකකින් පහත වැටෙමින් එම පක්ෂ නියෝජිත සංඛ්‍යාව දෙදෙනෙකු බවට පත්ව ඇත.

ඊට අමතරව ඉළංතෙයි තමිල් අරසු කච්චි නමින් මෙවර පළාත් පාලන මැතිවරණයට තරඟ කළ දෙමළ ජාතික සන්ධානයට නගර සභා එකක සහ ප්‍රාදේශීය සභා හතරක් වශයෙන් පළාත් පාලන ආයතන 05 ක බලය හිමිව ඇත. ලංකා ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් සන්ධානය නගර සභා එකක සහ ස්වාධීන කණ්ඩායමක් තවත් ප්‍රාදේශීය සභාවක බලය හිමිකර ගනිමින් මෙවර පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලය ප්‍රකාශයට පත්ව ඇත.



> ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ ඔහුගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවත් තවමත් තිබෙන්නේ ජනප්‍රියත්වයේ හිනිපෙත්තේය. තවද ජනාධිපතිවරයාගේ සහ ආණ්ඩුවේ කීමට තරම් දොසක් ඇති බවක් පෙනෙන්නට ද නොමැත. එසේ වුවද ජනාධිපතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාට එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාට වඩා ලබා ගැනීමට හැකි වුයේ ඡන්ද ලක්ෂයකටත් වඩා අඩු සංඛ්‍යාවකි.

එක්සත් ජනතා නිදහස් සන්ධානය මෙවර පළාත් පාලන මැතිවරණයේදී විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබීම පුදුම විය යුතු කාරණයක් නොව ගමට හිතවත්, ගම සංවර්ධනය කරමින් රට සංවර්ධනය කරන රටේ සංවර්ධනයට ගමේ සංවර්ධනය දායක කර ගන්න ප්‍රතිපත්තියක් වන මහින්ද චින්තන ප්‍රතිපත්ති වැඩපිළිවෙළක් සහිත ආණ්ඩුවක් මෙන්ම ජනාධිපතිවරයකු රටේ රාජ්‍ය බලය හෙබවීමත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා තේරී පත්ව තවම මාස හතරක් වැනි කාලයක්වත් ඉකුත්ව ගොස් නොතිබීමත් යන වාසිසහගත කාරණා බොහෝමයක්ම ඔවුන් සතුව පැවතීම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ජයග්‍රහණය පහසු කිරීමට හේතුවුවා නිසැකය. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ ඔහුගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවත් තවමත් තිබෙන්නේ ජනප්‍රියත්වයේ හිනිපෙත්තේය. තවද ජනාධිපතිවරයාගේ සහ ආණ්ඩුවේ කීමට තරම් දොසක් ඇති බවක් පෙනෙන්නට ද නොමැත. එසේ වුවද ජනාධිපතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාට එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාට වඩා ලබා ගැනීමට හැකි වුයේ ඡන්ද ලක්ෂයකටත් වඩා අඩු සංඛ්‍යාවකි. එසේ වූයේ එම අපේක්ෂකයාට සහය දැක්වූ කොටස්කාර පක්ෂ වන ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතික හෙළ උරුමයද ඔහුට සහය දැක්වූ අවස්ථාවකදීය.

මහින්ද රාජපක්ෂ මහතාට සහය දැක්වූ බලවේගවල කොටස්කරුවන් එනම්, ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතික හෙළ උරුමය මෙවර පළාත් පාලන මැතිවරණයේදී මෙන්ම තරඟ කිරීමේදී එහි වාසිය ස්වභාවිකව එක්සත් ජාතික පක්ෂයට හිමිවීමේ හැකියාවක්ද සහිතය. එජාපයට එවන් වාසියක් නොතිබූ බව කිසිවෙකුටත් පැවසිය නොහැක. මන්ද ජනතා විමුක්ති පෙරමුණු ප්‍රචාරක ව්‍යාපාරය දියත්වීමේදී ආණ්ඩුවට සහය දක්වන ඡන්ද දායකයාගේ ඡන්දය සෘජුවම ඉල්ලා සිටීමට ඔවුන් පෙළඹුණු බවක්ද දක්නට ලැබුණි. ඒ සඳහා ජවිපෙට ඇති අයිතිය පිළිබඳව ගැටළුවක් නොමැත. එසේ හැරුණු කොට ජාතික හෙළ උරුමයට හෝ ජනතා විමුක්ති පෙරමුණට එසේත් නැත්නම් එක්සත් ජාතික පක්ෂයට ආණ්ඩුවට එරෙහිව මැතිවරණ ව්‍යාපාරයේදී භාවිතවට ගන්නා බවක් දක්නට නොලැබුණි. එසේ වූයේ එවන් අවියක් නොමැති නිසා මිස එවැන්නක් මඟහැරී තිබූ නිසා නොව. ඒ හැරුණු කොට මැතිවරණ ව්‍යාපාරය ආරම්භයේ සිටම දක්නට ලැබුණු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඡන්ද ගොඩවල් බෙදීයාමේ අභියෝගයක සිටින කිහිපයකදී හැර සූක්ෂම ලෙස ජය ගැනීමට නිදහස් සන්ධානය සමත්ව ඇත.

එක්සත් ජාතික පක්ෂය ලබාගෙන ඇති ඡන්ද ප්‍රමාණය විශාල වශයෙන් අඩුවී තිබුණද වෙනත් පක්ෂයකින් නව ජනාධිපතිවරයකු තේරී පත්ව මාස හතරකට පසු පැවැත්වූ මැතිවරණයකදී එම පක්ෂය එවන් අයගේ සංඛ්‍යාවක් රැක ගැනීමට සමත්වීම එම පක්ෂයට ප්‍රාදේශීය මට්ටමෙන් පවතින ඡන්ද පදනම හේතුවෙන් ලැබී ඇති වරප්‍රසාදයක් වැනි කාරණයක් විනා එය පක්ෂයේ හෝ පක්ෂ නායකත්වයේ විශේෂ දක්ෂතාවයක් හේතු වෙන්වත් එම පක්ෂය ගෙනගිය ප්‍රචාරක ව්‍යාපාරයක ආකර්ෂණය හේතුවෙන්වත් ලැබී ඇති තත්ත්වයක් නොවන බව දේශපාලන හය හතර පවා නොතේරෙන ඕනෑම කුඩා දරුවකුට වුව තේරුම් ගතහැකි කාරණයකි.

එක්සත් ජාතික පක්ෂයේ සැලකිය යුතු නායකයින් පිරිසක් මෙන්ම ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන නියෝජිතයන් පක්ෂය හැරදා යමින් එම පක්ෂය අභ්‍යන්තරව ඛාදනයට ලක්වෙමින් පවතින මොහොතෙත් එවන් පළාත් පාලන ආයතන සංඛ්‍යාවක් රැක ගැනීමට හැකිවීමේ ගෞරවය හිමිවන්නේ එම පක්ෂයේ සාම්ප්‍රධායික ඡන්ද දායකයාට සහ ප්‍රාදේශීය දේශපාලන නායකත්වයන්ට බව පැහැදිලිය. මැතිවරණ දේශපාලනයේදී වැදගත් වන්නේ ඡන්ද පදනමය. ඒ අතින් බැලූ කළ මෙවර මැතිවරණයේදී වඩාත්ම අභියෝගයට මෙන්ම පසුබැස්මට ලක්ව ඇත්තේ එක්සත් ජාතික පක්ෂයය. දෙවනුව ජාතික හෙළ උරුමය වේ. රටේ ප්‍රධාන පක්ෂ දෙකෙන් එකක් වශයෙනුත් විපක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂය ලෙසත් මෙතෙක් වැජඹෙමින් තිබූ එක්සත් ජාතික පක්ෂය මෙවර පළාත් පාලන ආයතන පහකදී තෙවන ස්ථානයට පත්ව තිබීම එම පක්ෂයේ බිහින කලාවට ලබාදී ඇති සංඥාවක් යයි කෙනෙක් පවසන්නේ නම් එය එසේ නොවේ යයි කීමට හැකියාවක් නොමැත.

මැතිවරණය අවසන්ව දින කිහිපයක් පමණක් ගෙවී ගොස් ඇති අද වනවිට මහින්ද විජේසේකර මහතා හරහා එක්සත් ජාතික පක්ෂයේ අභ්‍යන්තර අර්බුදය නැවතත් මුදු වෙමින් තවත් අතුරු ප්‍රතිඵලයක් ලක්ෂණ පහළව ඇත.

මෙවර පළාත් පාලන මැතිවරණයේදී සිය බලාපොරොත්තු එළසම ඉටුවී නොමැති වුවද පැහැදිලි ඡන්ද වර්ධනයක් මෙන්ම නියෝජිත සංඛ්‍යාවේ වැඩිවීමක් දක්නට ලැබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේය. විශේෂයෙන් ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලබාදීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග මෙන්ම සටන් විරාම ගිවිසුම සම්බන්ධයෙන් රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර පැවති සාකච්ඡාවලදී මතුව ඇති ගැටළු සහගත කාරණා පැවති දේශපාලනය තුළ මතු කරමින් ඉතා අකර්ෂනීය මෙන්ම ආක්‍රමනශිලී ප්‍රචාරක ව්‍යාපාරයක් ගෙන ගියේද එම පක්ෂය වේ. එම ගැටළු සහගත කාරණා සම්බන්ධයෙන් ජාතික හෙළ උරුමයේ සහ ජවිපෙ සමානකම් ගණනාවක් දක්නට ලැබුණද සංවිධානාත්මකව එහි වාසිය ලබාගත හැකි පක්ෂය වූයේත් ඒ සඳහා ගැලපෙන ප්‍රචරක ව්‍යාපාරයක් මෙන්ම යාන්ත්‍රණයක් සතුවූ පක්ෂය ද ජවිපෙ ය. එසේ බැලූ කළ මෙවර මැතිවරණයේදී වාර්තා කළ ජනප්‍රියම සටන් පාඨවල හා විචේජනයේ වාසිය ග්‍රහණය කර ගැනීමේ හැකියාව සහිත පක්ෂය වූයේ ද ජවිපෙය.

එහිදී ජාතික හෙළ උරුමයට ඔවුන් සමඟ හෙට්ටු කිරීමට නොහැකි විය. හෙළ උරුමයට අභියෝගයක් වෙමින් එම මතවාදයේ ඡන්දත් කීර්තිමත් නව ජනාධිපතිවරයකු පත් කර ගැනීමට දායක වූ උද්ධාමයට පත් ඡන්දවලින් යම් ප්‍රතිශතයකුත් ආණ්ඩුව නිවැරදි කර ගැනීම සඳහා වූ ඡන්දවල මෙන්ම එජාපය පිළිබඳව කළ කිරුණු පාවෙන ඡන්දවල යම් ප්‍රතිශතයකුත් ඉතා සූක්ෂම ලෙස තමන් වෙත හරහා ගැනීමට ඔවුන් සමත්ව ඇත. එය වෙනත් ලෙසකට පැවසුවොත් බැංකු කිහිපයක මුදල් සිය ගිණුමට බැර කර ගැනීමට මෙවර මැතිවරණයේදී ජවිපෙ උපක්‍රමශිලීව ඇත. ඒ සියළුම කාරණා මධ්‍යයේ වුව මෙරටට සාමය සංවර්ධනය මෙන්ම සමගිය ප්‍රාර්ථනා කරන මෙරට මහජනතාව ඒ සියල්ලට මුලපුරා ඇති ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාවත් ඔහුගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවත් ශක්තිමත් කිරීමටද වගබලා ගෙන ඇති බව කිව හැකිය.